ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

**පුවත්පත් නිවේදනය**

# විදේශ ලේකම් විනේ ක්වාත්රා මහතාගේ ප්රධානත්වයෙන් යුත් ඉන්දීය දූත පිරිසක් ශ්රී ලංකාවේ සංචාරයක නිරත වේ

විදේශ ලේකම් විනේ ක්වාත්රා මහතාගේ ප්රධානත්වයෙන් යුත් ඉන්දීය රජයේ ජ්යෙෂ්ඨ නියෝජිත පිරිසක් 2022 ජූනි 23 වන දින ශ්රී ලංකාවට පැමිණියහ. ආර්ථික කටයුතු දෙපාර්තමේන්තුවේ ලේකම් ශ්රී අජේ සෙත්, ප්රධාන ආර්ථික උපදේශක ආචාර්ය වී. ආනන්ද නාගේශ්වරන්, විදේශ කටයුතු අමාත්යාංශයේ ඉන්දීය සාගර කලාපයේ ඒකාබද්ධ ලේකම් කාර්තික් පාණ්ඩේ යන මහත්වරු මෙම නියෝජිත පිරිසට ඇතුළත් වූහ.

2. නියෝජිත පිරිස මෙම සංචාරය අතරතුරදී ශ්රී ලංකා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සහ ශ්රී ලංකා අග්රාමාත්ය රනිල් වික්රමසිංහ මහතා සමඟ සාකච්ඡා පැවැත්වූහ. දෙපාර්ශවය අතර සාකච්ඡා අවංක, සුහද සහ ඵලදායි අයුරින් පැවැත්විණ.

3. ඉන්දියාව විසින් මෑත කාලයේදී පෙර නොවූ විරූ ලෙස ශ්රී ලංකාවේ ජනතාවට ලබා දුන් ඇමරිකානු ඩොලර් බිලියන 3.5කට අධික ආර්ථික, මූල්ය සහ මානුෂීය සහයෝගය අග්රාමාත්ය ශ්රී නරේන්ද්ර මෝදි මැතිතුමාගේ “අසල්වැසියා ප්රථමයෙන්” යන ප්රතිපත්තිය සහ කලාපයේ සැමට ආරක්ෂාව සහ වර්ධනය (Security and Growth for All in the Region - SAGAR) යන දැක්ම මත පදනම් වන බව ඉන්දීය නියෝජිත පිරිස පෙන්වා දුන්හ.

4. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා සමඟ පැවති සාකච්ඡාවේ දී ඉන්දීය පාර්ශවය ඉන්දු - ශ්‍රී ලංකා ද්විපාර්ශවික සබඳතා වර්ධනය කිරීම සඳහා එතුමා විසින් දක්වන කැපවීම සම්බන්ධයෙන් සිය ස්තුතිය පළ කර සිටියේය. මෙහිදී ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික තත්ත්වය සහ ඉන්දියාව විසින් ලබා දෙන සහයෝගය පිළිබඳ අදහස් ඵලදායි ලෙස හුවමාරු කර ගැනිණ. අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා සමඟ පැවති හමුවේ දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය පිළිබඳව සහ ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ගෙන ඇති ප්‍රයත්නයන් පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡා කෙරිණ. මෙම සන්දර්භය තුළ යටිතල පහසුකම්, සම්බන්ධකතාවය, පුනර්ජනනීය බලශක්තිය වැනි ක්ෂේත්‍ර ඇතුළු ඉන්දු - ශ්‍රී ලංකා ආයෝජන සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීමේ සහ දෙරට අතර ආර්ථික සබඳතා ගැඹුරු කිරීමේ වැදගත්කම දෙපාර්ශවය විසින් අවධාරණය කරන ලදී.

5. ඉන්දීය විදේශ ලේකම්තුමා ශ්‍රී ලංකා විදේශ ලේකම් අරුණි විජේවර්ධන මහත්මිය සමඟ ද සාකච්ඡාවක නිරත විය. රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ශක්තිමත් කිරීම සහ නුදුරු දිනයකදී ද්විපාර්ශවික සංචාරයක නිරත වීම සඳහා සමීප සම්බන්ධීකරණයකින් කටයුතු කිරීමට විදේශ ලේකම්වරු දෙපළ මෙහිදී එකඟ වූහ.

6. ශ්‍රී ලංකා පාර්ශවය ඉන්දීය රජය සහ ජනතාව විසින් පසුගිය වසර කිහිපය පුරා ත්‍රස්තවාදය මැඩ පැවැත්වීම, සමුද්‍රීය ආරක්ෂාව, ආපදා කළමනාකරණය, මානුෂීය සහයෝගය, සංවර්ධන සහයෝගීතාවය, වාණිජ සබඳතා සහ දෙරට ජනතාව අතර බැඳීම් වැනි විවිධ ක්ෂේත්‍රයන් හි අඛණ්ඩව ලබා දී තිබෙන සහයෝගය අගය කළේය.

7. ඉන්දියාව විසින් ලබා දී තිබෙන සංවර්ධන සහයෝගීතාවය ඇමරිකානු ඩොලර් බිලියන 5කට අධික අතර එයින් ඇමරිකානු ඩොලර් මිලියන 600කට වැඩි ප්‍රමාණයක් ප්‍රදාන වශයෙන් ලබා දී

ඇත. මෙම ප්‍රදානයන්ට ශ්‍රී ලංකා ඒකීය ඩිජිටල් අනන්‍යතා රාමුව ද ඇතුළත් වේ.

8. මෙම වසරේ මාර්තු මාසයේදී පැවති IMF සාකච්ඡාවලදී සහ ඉන් අනතුරව පැවති විවිධ කලාපීය සහ බහුපාර්ශවීය සමුළු වලදී ඉන්දියාව විසින් ලබා දුන් සහයෝගය සම්බන්ධයෙන් ද ශ්‍රී ලංකා පාර්ශවය ස්තුතිය පළ කළේය. පශ්චාත් කොවිඩ් සමය තුළ ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් කිරීම උදෙසා ශ්‍රී ලංකාවට සහය ලබා දීමට අනෙකුත් රටවල් දිරිගැන්වීම සඳහා ඉන්දියානු නායකත්වය විසින් ගනු ලැබූ පියවර සම්බන්ධයෙන් ද ශ්‍රී ලංකා පාර්ශවය කෘතවේදීත්වය පළ කර සිටියේය.

*****

***කොළඹ***
***2022 ජූනි 23***